සිංහල පරිවර්තනය

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වන නිවේදනය

1987 වර්ෂයේ අංක 42 දරණ පළාත් සභා පනතේ IV කොටසට අනුව පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පළාතේ ගරු ආණ්ඩුකාරවර විසින් පවරන ලද පත්වීම්, ස්ථාන මාරු, විනය ක්‍රියාමාර්ග හා තනතුරින් පහ කිරීම යන කටයුතු සම්බන්ධයෙන් වූ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රධාන ලේකම්, අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලතල පවරා ඇත.

බලතල පවරන ලද බලධාරිවරයා විසින් තමන්ට පවරණ ලද බලතල යටතේ පත්වීම් එනම් පරිවාස කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම, උපයන ලද වාර්ෂික වැටුප් වර්ධකය ලබා ගැනීම, කාර්යක්ෂමතා කඩඉම හා දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත්වීම වැනි සේවා කොන්දේසීන් සපුරා ඇති අයට වාර්ෂික වැටුප් වර්ධක ලබා නොදීම, පත්වීම් ස්ථිර නොකිරීම හා තනතුරු උසස්වීම් ලබා නොදීම යන කරුණු ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද පළාත් ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලව ස්ථානමාරු ලැබූ නිලධාරීන් එයින් තමන් වින්දිතයන් සේ සැලකීම, පළාත් නිලධාරීන්ට විරුද්ධව විනය කටයුතු වලදී විධිමත් විනය පරීක්ෂණයකදී දඬුවම් පැනවීමට පෙර සිදු කරන ලද දඬුවම් ස්ථාන මාරුව, වාර්ෂික වැටුප් වර්ධකය ලබා නොදීම වැනි ක්‍රියාමාර්ග නිසා බලපෑමට ලක් වූ නිලධාරීන්ට සිදුවූ බලපෑමට එරෙහිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.

එවැනි අභියාචනාවක් ඉදිරිපත් කරන්නන් අගතියට ලක් වූ නියෝගය ලැබී මාස හයක්(06) ක් ඇතුළත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එම නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

මේ වන විට සේවයේ නොමැති නිලධාරියෙකු තම අභියාචනය තමා අවසන් වර සේවය කළ දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සෘජුවම ඉදිරිපත් කළ හැකිය.

අභියාචනා පිටපත් භාරදීමට හා පැමිණිලිකරුවන්ට උපදෙස් ලබාදීමට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දිස්ත්‍රික් මට්ටමින් පිහිටි සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල මෙම කටයුතු සඳහා පිහිටුවා ඇති කවුන්ටර වලින් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ද පියවර ගනු ලැබේ.

එමෙන්ම අභියාචනා ඉදිරිපත් කිරීමට මනාප නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් වූ සේවාව, 2022 ජනවාරි මස පහත සඳහන් පරිදි පැවැත්වීමට නියමිතය.

| දිනය | කාලය | ස්ථානය |
|---|---|---|
| 05.01.2022 | 10.00 - 2.00 | ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මුලතිව්. |
| 10.01.2022 | 10.00 - 2.00 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත |
| 12.01.2022 | 10.00 - 2.00 | ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, වවුනියාව |
| 19.01.2022 | 10.00 - 2.00 | ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මන්නාරම |
| 26.01.2022 | 10.00 - 2.00 | ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, කිලිනොච්චිය. |

ස. තිරුවාකරන්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.

S.Thiruvakaran
Secretary
Provincial Public Service Commission
Northern Province